# සුරකිමු මිහිතලය නිබඳ අප පණසේ

හිරු පායා එන උදයේ මල් පිපිලා
කුරුළු හඬින් මුළු ලෝකය අවදි වෙලා
මද සුළඟින් අප සනසයි පවන් සළා
සොබා දහම අප රකිනව සතුටු වෙලා

තාක්‍ෂණය මුළු ලොව තුළ පැතිරෙන්නේ
එදා තිබුණු සුන්දර ලොව වැනසෙන්නේ
දැනුමින් නම් මිනිසා ඉහළට යන්නේ
එනමුත් ගුණ දම් වැනසීගෙන යන්නේ

කම්හල් වලින් පිටවන දුම කොතරම්ද
වාහනවලින් පිටවන දුම කොතරම්ද
ගස්කප කපා ඉන්නා අය කොතරම්ද
මේ වියසනය අප හට ඉවසිය හැකිද

මේ මිහිතලය සුරැකිය යුතු අය අපමයි
ගෙවනා හැම මෙහොතෙම ඒ ගැන සිතිය යුතුයි
පරිසර අහිතකාමීන් ගැන සෙවිය යුතුයි
උන් හදලා මිහිතලයම රැකිය යුතුයි

කපන ගසට ගස් සියයක් වවන්නට
පිරිසිදු වූ වායුව ගැන සිතන්නට
පරිසරයට එක්වන දුම නසන්නට
වැඩිහිටියෝ නොහිතන්නේ අපෙ පවට

නිල් අතු පතර එක් වී සැදුණු වියන
මග තොට යන අයට ගෙන දෙයි සුව සහන
අතු ඉති නමාගෙන හමනා මද පවන
කොතරම් අපූරුද නිවනා ගත හිමන

සියොත් නගන නාදය නම් කන්කළුය
ගස්වැල් වලින් මවන රටා මනරම්ය
සිත්කළු මගේ ලෝකය හරි සුන්දරය
මේ ලොව නිබඳවම අප රැක ගත යුතුය

ගිරිශිඛර සිසාරා ඇද හැලෙයි දිය දහර
සියොතුන්ගේ නද මුසුව ගිගුම් දෙයි නද බඹර
අහිත ලෙස වැඩ කළොත් අපට නෑ මේ මිහිර
පුංචි අපි ලොව රකිමු රැක ගන්න මේ මිහිර

ලාලිත්‍ය යසපත් වික්‍රමසේකර,
9 / ශ්‍රේණිය,
මො/ධර්මප්‍රදීප මහා විද්‍යාලය,
බිබිල.

( 2005 ලෝක පරිසර දිනය නිමිත්තෙන් පවත්වනු ලැබූ පද්‍ය නිර්මාණ තරගාවලියේ කණිෂ්ඨ අංශයේ පළමු ස්ථානය )